தமிழ் இளையோர் அமைப்பு
**Tamil Youth Organisation**
"Empowering Youth to Excel as Leaders and Architects of Our Nation"

# ගෝලීය දෙමළ තරුණ ජනයා, ඊළම් දෙමළ ජනයා සඳහා ස්වයං නිර්ණ අයිතිය මත පදනම් වූ රාජ්‍යත්වය ඉල්ලා සිටිති

ගැඹුරුවන ආර්ථික අර්බුදයකට ශ්‍රී ලංකාව මුහුණ දී ඇති අතර ආර්ථික තත්ත්වය පාලනයකින් තොරව අර්බුදයට ලක්වෙමින් පවතී. 1948 ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස් වූ දා සිටම දෙමළ ඊළම ලෙස නිශ්චිතව සළකුණු වූ ඓතිහාසික හා පාරම්පරික නිජබිමකට හිමිකම් කී ඊළම් දෙමළ ජනයාට එරෙහි වර්ග සංහාරය උත්සන්න කරනු ලැබුණි. ඊළම් දෙමළ ජාතිය වැනසීමේ සැලැස්ම යටතේ, ඊළම් දෙමළ ජනයාගේ පාරම්පරික නිජබිමත්, ආර්ථිකයත්, විශේෂිත සංස්කෘතියත්, ඉතිහාසයත්, උරුමය සහ භාෂාවත් ක්‍රමානුකූලව ඉලක්ක කොට කොට විනාශ කිරීම කලින් කලට පත් වූ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සිදුකරන ලදී. ඊළම් දෙමළ ජනයාට එරෙහි වර්ග සංහාරයට අරමුදල් සපයාගනු පිණිස කලින් කල පත් වූ ශ්‍රී ලංකා ආණ්ඩු විසින් විශාල ධනස්කන්ධයක් වැයකරමින්, රාජ්‍ය සම්පත් යොදාගනු ලැබුණි. ඊළම් දෙමළ ජාතිය බිඳ දමා දුර්වල කොට, ඔවුන්ගේ ඓතිහාසික පාරම්පරික නිජබිම් පිළිබඳ අයිතිය ප්‍රතික්ෂේප කිරීමටත් ගාමක බලයන් වූයේ සිංහල බෞද්ධ ස්වෝත්තමවාදී පිළිවෙත් වන වාඩි ලා ගැනීම්, හමුදාකරණය සහ ඉඩම් කොල්ලයයි. ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික තත්ත්වයේ මූල හේතුව නිසැක වශයෙන්ම මෙකී උපාය මාර්ගය සහ රාජ්‍ය ප්‍රතිපත්තියයි.

වර්තමානයේදී ශ්‍රී ලංකාව සන්ධිස්ථානයකට එළඹ සිටියි. එහි සියළු හවුල්කරුවන්ට ශ්‍රී ලංකාව අසමත් රාජ්‍යයක් වශයෙන් හඳුනාගැනීමට කාලය එළඹ තිබේ. එහි පුරවැසියන් වෙනුවෙන් අවම කාර්යයන් හා වගකීම් සපුරාලීමට එය අපොහොසත් ය. එමෙන්ම, ශ්‍රී ලංකා රජය විසින් මුදාහරින නොනවතින පීඩනයත්, වාඩිලා ගැනීමුත්, වර්ග සංහාරක ප්‍රතිපත්තිත් නිසා ඊළම් දෙමළ ජනයා තවදුරටත් දරුණු ලෙස පීඩිතව සිටිති. ඉතිහාසය විසින් පෙන්වා දෙන්නේ, කවුරුන් බලයේ සිටියද දෙමළ ජනයාට එරෙහි වර්ග සංහාරය අඛණ්ඩව සිදුකෙරෙන බව ය. ශ්‍රී ලංකා රජයට ඇති පාලනයෙහි අසමත්කම හේතුවෙන් ඊළම් දෙමළ ජනයා තවදුරටත් දුක් පීඩා විඳිය යුතු නොවේ. වත්මන් ආර්ථික අර්බුදය විසඳාලීමේ කවර හෝ උත්සාහයක් වෙත්නම් එය, ඊළම් දෙමළ ජනයාගේ පාරම්පරික නිජබිම වන දෙමළ ඊළාමයේ ස්වාධීනත්වයත්, ස්වෛරීභාවයත් පිළිගනිමින් සැපයෙන තිරසාර විසඳුමක් මත පූර්ණ වශයෙන්ම රඳා පැවතිය යුතු බව අපි කියා සිටිමු. ඊළම් දෙමළ ජනයාගේ දේශපාලන අභිලාෂය වන්නේ, තමන් විසින්ම ඇළසුම් කළ ගමන් මගක් ඔස්සේ ස්වකීය දේශපාලන ඉරණම හඹා යන්නා වූත්, තීරණ ගැනීමේදී කොළඹ පාලනයේ ප්‍රාණ ඇපයට පත් නොවන්නාවූත්, ශ්‍රී ලංකා රාජ්‍යයට යාබදව ඒ හා සාමයෙන් පවතින්නා වූත් ස්වාධීන දෙමළ ඊළම් රාජ්‍යයකි. දීර්ඝ කාලයක් තිස්සේ නොවිසඳුණු දෙමළ ජාතික ප්‍රශ්නය විසඳාලීම, ශ්‍රී ලංකාවේ සෞභාග්‍යය සහ අනාගතය හා බැඳී පවතී.

ඊළම් දෙමළ ජනයාගේ අනුල්ලංඝනීය ජාතික ස්වයං නිර්ණ අයිතිය පිළිගන්නා මෙන් අපි, සිංහල ජනයාගෙන්ද, සිවිල් සමාජයෙන්ද, බුද්ධිමතුන් සහ දේශපාලන නායකයන්ගෙන්ද ඉල්ලා සිටිමු. පසුගිය සති කිහිපය තුළ, සිංහල තරුණ ජනයා ඊළම් දෙමළ ජනයාගේ අයිතීන් සහ යුක්තිය වෙනුවෙන් පෙනී සිටිනු අපි දුටිමු. ඊළම් දෙමළ ජාතියේ යුක්ති සහගත අභිලාෂයන් වෙනුවෙන් ඔවුන්ගේ මිත්‍රත්වයත්, හඬත්, සහයෝගීතාවත් අඛණ්ඩව ලබාදෙන මෙන් අපි ඔවුන්ගෙන් ඉල්ලා සිටිමු.

ඊළම් දෙමළ ජනයාගේ ඓතිහාසික සහ පාරම්පරික නිජබිම් තුළ රාජ්‍යත්වය සඳහා ඔවුන්ට ඇති අයිතිය පිළිගන්නා මෙන් අපි ජාත්‍යන්තර ප්‍රජාවෙන් ඉල්ලා සිටිමු. තවද, ශ්‍රී ලංකාවට එරෙහි ඉක්මන් ක්‍රියාමාර්ගයක් අනුගමනය කරමින්, ඊළම් දෙමළ ජනයාට එරෙහිව සිදුකළ යුද අපරාධ, මානව වර්ගයාට එරෙහි අපරාධ හා වර්ග සංහාරය පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍යය වගඋත්තරදායක කරන මෙන්ද ජාත්‍යන්තර ප්‍රජාවෙන් අපි ඉල්ලා සිටිමු.

දෙමළ ඊළාමයේ වාඩිලා ගැනීම් අවසන් කොට, ජාතික ස්වයං නිර්ණය සඳහා ඊළම් දෙමළ ජාතියට ඇති අනුල්ලංඝනීය අයිතිය පිළිගැනීම වනාහී ශ්‍රී ලංකා ද්වීපයේ ජීවත්වන ඊළම් දෙමළ ජනයාටත්, සිංහල ජනයාටත් සාමය සහ සෞභාග්‍යය ගෙනදිය හැකි එකම විසඳුම වේ.

This statement has been endorsed by the following organisations:

- TYO Belgium
- TYO Canada
- TYO Denmark
- TYO France
- TYO Finland
- TYO Germany
- TYO Switzerland
- TYO Netherlands
- TYO Norway
- TYO New Zealand
- TYO UK
- Giovani Tamil
- Surrey Tamil Society
- City Tamil society
- Aston Tamil society
- University of York
- Herts Tamil society
- Brunel Tamil Society
- Loughborough Tamil society
- St. George's Tamil society
- Liverpool Tamil Society
- Eela Maintharkal
- York University Tamil Students Association (YUTSA)
- University of Toronto - St.George Campus (UTSG)
- McMaster University Tamil Students Association (MACTSA)
- Canadian Tamil Youth Alliance (CTYA)